www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආරක්ෂක ලේකම්වරයා පුවත්පත් කතුවරියට තර්ජනය කරයි

## Sri Lankan defence secretary menaces newspaper editor

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2007 අප්‍රේල් 24**

ඩේලි මිරර් ඉංග්‍රීසි පුවත්පතේ අප්‍රේල් 16 හා 17 කලාපවල පල වූ ලිපි දෙකක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පසු ගිය සතියේ එහි කතුවරියට තර්ජනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට තව දුරටත් එල්ල වූ ප්‍රහාරයකි. ලිපි දෙකෙන් පලමු වැන්න කරුනා කන්ඩායම නමින් හඳුන්වනු ලබන ආන්ඩුවට හිතැති සන්නද්ධ කන්ඩායමේ ක්‍රියාකාරකම් පිලිබඳව විය. දෙවැන්න නැගෙනහිරෙහි දෙමල සරනාගතයන් මුහුන දෙන භයංකර තත්ත්වයන් පිලිබඳව විය.

මෙම තර්ජනය මිලිටරිය හා දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව එය ගෙන යන ආක්‍රමනය සම්බන්ධයෙන් සිදු කරන කවර හෝ විවේචනයක් වුව මැඩ ලීමට ආන්ඩුව විසින් ගන්නා ලද දීර්ඝ පියවරයන් මාලාවක මෑත ම පියවර යි. ආරක්ෂක ලේකම්වරයා වන්නේ 2005 නොවැම්බරයේ බලයට පත් තැන් පටන් මේ වන තෙක් ම දිවයින යලි යුද්ධයට ඇද දැමීමට ක්‍රියා කොට ඇති ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සොහොයුරා ය.

ලිපි දෙක පල වීමෙන් අනතුරුව ඉන් ප්‍රකෝප වූ ගෝඨාභය රාජපක්ෂ පුවත්පතේ කතුවරිය වූ චම්පික ලියනාරච්චිට දුරකථනයෙන් ඇමතී ය. ආරක්ෂක ලේකම්වරයා මෙසේ කී බව ලියනාරච්චි වාර්තා කලා ය: "කරුනා කන්ඩායම ප්‍රචන්ඩකාරීව ඔබට එරෙහිව යොමු වුනොත් පුදුමයට පත් වෙන්න එපා. ඒක සිද්ධ වුනොත් ඔබේ රැකවරනයට ආන්ඩුවෙන් කිසි ම ආරක්ෂාවක් බලාපොරොත්තු වෙන්න එපා."

කතුවරියට ඉල්ලා අස් වන ලෙසත් නැති නම් පුවත්පතට එරෙහිව එල්ල විය හැකි ප්‍රතිප්‍රහාරයක් වලක්වා ගැනීමේ පදනම මත ඇය සේවයෙන් පහ කරන මෙන් කලමනාකාරිත්වයට බල කරන බවත් අනතුරුව රාජපක්ෂ කියා සිටියේ ය. එක් ලිපියක් ලියූ උදිතා ජයසිංහ නම් පුවත්පත් කලාවේදිනිය ගැන ආරක්ෂක ලේකම්වරයා ලියනාරච්චිට කෙලින් ම මෙසේ පැවසී ය: "මම ඇය සහමුලින් වනසා දමනවා."

ශ්‍රී ලංකාව තුල දී එබඳු ප්‍රකාශයන් පලක් නැති තර්ජන ලෙස සැලකිය නොහැකි ය. පසු ගිය වසර තිස්සේ ජනමාධ්‍ය සේවකයන් නව දෙනෙකු ඝාතනයට ලක් කොට තිබේ. ඉන් බහුතරය දෙමල පුවත්පත් කලාවේදීන් වූ අතර, මෙම ඝාතන සිදු කෙරුනේ මිලිටරිය හෝ කරුනා කන්ඩායම වැනි එය හා සහයෝගී පැරාමිලිටරි කන්ඩායම් ඊට සම්බන්ධ බවට බලගතු ලෙස ඇඟවුම් කෙරෙන කොන්දේසි යටතේ ය. රාජපක්ෂ විසින් ආරක්ෂාව සැපයීම ප්‍රතික්ෂේප කිරීම පුවත්පතට හා එහි කතුවරියට කායික ප්‍රහාරයක් එල්ල කිරීම පිනිස කෙරෙන ඇරයුමකට සමාන වේ.

"සන්නද්ධ කරුනා කණ්ඩායම පොතුවිල්හි සිය අනසක පවත්වා ගෙන යයි" යන මැයෙන් යුතුව අප්‍රේල් 16 දා පල වූ ලිපිය, ආරක්ෂක හමුදාවන් කරුනා කන්ඩායම සමග සහයෝගීව කටයුතු නොකරන බවට ආන්ඩුව කරන ව්‍යාජ ප්‍රකාශය පැහැදිලිව ම හෙලිදරව් කරයි. නැගෙනහිර පිහිටි පොතුවිල් නගරයේ මුස්ලිම් වැසියන් කෝපයෙන් යුතුව ඩේලි මිරර් පුවත්පතට ප්‍රකාශ කලේ ජනතාවට තර්ජනය කරමින් හා කප්පම් ගනිමින් කරුනාගේ සන්නද්ධ මැරයන් ප්‍රදේශයේ නිදහසේ සැරි සරන බව යි. මුස්ලිම් සාම මහ ලේකම් කාර්යාලය (පීඑස්එම්) නමින් හැඳින්වෙන සන්ධානයක් මේ සම්බන්ධයෙන් ආන්ඩුවට හා සාම ක්‍රියාදාමයේ ජාත්‍යන්තර සමසභාපතිවරුන්ට විරෝධතාව පල කොට ඇතත් එයින් කිසිදු සෙතක් සැලසී නැත.

"නීතිය හා සාමය ආරක්ෂා කිරීම පොලීසියේ රාජකාරිය යි. විශේෂ අවස්ථාවල දී හමුදාවට කාර්ය භාරයක් තිබෙනවා. ඒත් පොතුවිල්වල දී කරුනා කන්ඩායම නගරය පුරා අනසක පවත්වා ගෙන යන අතරෙ එස්ටීඑෆ් එක (පොලිස් කොමාන්ඩෝවරුන්) ඇතුලු පොලීසිය හා හමුදාව පැත්තකට වී නිකං බලා සිටින්නන් බවට පත් වෙලා" යි පීඑස්එම්හි ප්‍රකාශකයෙක් පුවත්පතට පැවසී ය.

2002 සටන් විරාම ගිවිසුමෙන් ඉල්ලා සිටි පරිදි කරුනා කන්ඩායම වැනි පැරාමිලිටරි කන්ඩායම් නිරායුධ කරන ලෙස එල්ටීටීඊය කල ඉල්ලීම් රාජපක්ෂ ආන්ඩුව විසින්

යලි යලිත් ප්‍රතික්ෂේප කොට තිබේ. ඒ සම්බන්ධයෙන් ආන්ඩුව කියා සිටින්නේ කරුනා කන්ඩායම ආන්ඩුවේ පාලනය යටතේ පවතින ප්‍රදේශවල ක්‍රියාත්මක වන්නේ නැති බව යි. එලිපිට තර්ජනය කිරීමටත් කප්පම් ගැනීමටත් ආරක්ෂක හමුදා කරුනා කන්ඩායමට හා අනෙකුත් සන්නද්ධ කන්ඩායම්වලට ඉඩ දෙන බව ඩේලි මිරර් පුවත්පත සනාථ කලේ ය. පැහැර ගෙන යාම් හා ඝාතන ඇතුලු වඩා දැවැන්ත වූ අපරාධ සිදු කිරීමේ දී තිරයෙන් පිටුපස සිට ඔවුහු නිසැකව මිලිටරියේ කන්ඩායම් සමග ක්‍රියාත්මක වෙති.

උදිතා ජයසිංහ විසින් අප්‍රේල් 17 දා ලියන ලද දෙවන ලිපිය "මුතුර්හි අභ්‍යන්තරව අවතැන් වූවෝ: යුද්ධයේ වේශයෙන් ආ මිනිසා විසින් නිර්මානය කල සුනාමියකට එරෙහිව සටන් වැදීම" යන මැයෙන් යුතු විය. එය ත්‍රිකුනාමල හා මඩකලපු දිස්ත්‍රික්කවල මිලිටරිය විසින් කර ගෙන යන ආක්‍රමනයන්හි ප්‍රතිඵලයක් ලෙස සරනාගතයන් මුහුන දෙන භයංකර තත්ත්වයන් පැහැදිලි කලේ ය. එහි එන සම්මුඛ සාකච්ඡා හා ප්‍රකාශයන් මගින් එල්ටීටීඊ ප්‍රදේශ තුල "කොටු වී" සිටින ජනයාට සහාය පිනිස "මානුෂීය මෙහෙයුම්වල" යෙදී සිටින බවට ආන්ඩුව කරන කියාපෑම්වලට යටින් වල කපනු ලැබ ඇත.

යථාර්ථය වන්නේ පසු ගිය ජූලි මස පටන් 2002 සටන් විරාමය විවෘතව උල්ලංඝනය කරමින් හමුදාව එල්ටීටීඊ ප්‍රදේශ අත්පත් කර ගැනීම පිනිස ආක්‍රමනකාරී මෙහෙයුම් මාලාවක් ම සිදු කොට ඇත්තේ ය යන්න යි. ප්‍රදේශයේ ජනතාව භීතියට ලක් කොට පලවා හරිනු පිනිස හමුදාව හිතාමතා සිවිල් ජනයා වෙසෙන ප්‍රදේශවලට ෂෙල් වෙඩි හා බෝම්බ ප්‍රහාර එල්ල කොට සිය ගනනක් මරා දමා ලක්ෂ ගනනක් පලවා හැර තිබේ. ප්‍රමානවත් ආහාර, වාසස්ථාන හා ඖෂධ නොමැතිව මෙම සරනාගතයෝ දැන් සිය දෛනික අවශ්‍යතා පමනක් සපුරා ගනිමින් නැගෙනහිර පුරා පිහිටුවා ඇති කඳවුරුවල දිවි ගෙවති. මුතූර් ප්‍රදේශයෙන් අවතැන් වූවෝ පසු ගිය අගෝස්තුවේ පටන් එබඳු තත්ත්වයන් යටතේ දිවි ගෙවති.

ඩේලි මිරර් පුවත්පත ආරක්ෂක ලේකම්වරයාගේ ප්‍රකාශයන් ප්‍රසිද්ධියට පත් කිරීමෙන් අනතුරුව, සියලු කතාබහ තුල පැවතියේ "ඍජුව අදහස් හුවමාරු කර ගැනීමක්" බව කියමින් ඔහු පුවත්පතේ කතුවරියට තර්ජනය කිරීමක් සිදු වූ බව ප්‍රතික්ෂේප කිරීමේ අසාර්ථක ප්‍රයත්නයක යෙදුනේ ය. ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවියට ලියමින් රාජපක්ෂ ප්‍රකාශ කලේ, තමන් ලියනාරච්චිට කියා සිටියේ ලිපි දෙක "ජාතික ආරක්ෂාවට හානිකර ය" යන්න බව යි. එක් ලිපියක් " වාර්ගික වෛරය" වර්ධනය කල අතර, "අනෙක ආරක්ෂක හමුදාවල යහපත් ප්‍රතිරූපයට හානි කිරීමට උත්සාහ කලේ යැ"යි ඔහු පැවසී ය.

රාජපක්ෂගේ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ, "ජාතික ආරක්ෂාවේ" නාමයෙන් ආන්ඩුව හා මිලිටරිය යුද්ධය පිලිබඳව කරන සියලු විවේචන, අතිශය සීමිත වූ විවේචනයන් පවා නතර කිරීමක් ඉල්ලා සිටින බව යි. ඩේලි මිරර් පුවත්පතට එරෙහි තර්ජනය ආන්ඩුව යොදා ගන්නා විධික්‍රමයන් කවරේ ද යන්න පිලිබඳව තව දුරටත් කෙරෙන අනතුරු ඇඟවීමකි. පවත්නා හදිසි නීති තත්ත්වය යටතේ මාධ්‍යවල කට බැඳීම සඳහා අවශ්‍ය පුලුල් බලතල ජනාධිපති රාජපක්ෂ සතුව තිබේ. එහෙත් තව දුර දේශපාලන විරුද්ධත්වය ඇවිස්සීමක් සිදු වීම මග හැරීම පිනිස ඔහු ඒවා පාවිච්චියට ගැනීමෙන් වැලකී තිබේ.

ශ්‍රී ලංකා පුවත්පත් කතුවරුන්ගේ සංසදය ප්‍රකාශයක් නිකුත් කරමින් මෙසේ කියා සිටියේ ය: "මෙය මාධ්‍ය නිදහසට හා කර්තෘමය ස්වාධීනත්වයට බරපතල තර්ජනයක් යැයි අපි සලකන්නෙමු.... ආන්ඩුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකුගේ හැසිරීම සංසදය මුලුමනින් ම හෙලා දකින්නෙමු." "රට තුල පවතින දහනශීලී තත්ත්වය තුල මෙම තර්ජනය මගින් ශ්‍රී ලංකාවේ සමස්ත මාධ්‍ය ප්‍රජාවට ම බියකරු පනිවුඩයක් යැවෙනු ඇතැයි ද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය බියට පත්ව සිටී" යැයි ප්‍රකාශ කරමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (එෆ්එම්එම්) ද ආරක්ෂක ලේකම්වරයාගේ ප්‍රකාශය විවේචනය කලේ ය.

සිදු වූ දේශපාලන හානිය පිරියම් කිරීමට ජනාධිපති රාජපක්ෂ උත්සාහ දරා තිබේ. පුවත්පතට අනුව ඔහු ලියනාරච්චිට දුරකථනයෙන් අමතා තර්ජනයන් පිලිබඳව "පරීක්ෂනයක් පවත්වන බවට පොරොන්දු විය." එම මුල පිරීමට හුරේ දමමින් ද සිය සොහොයුරා හා අනෙකුත් නිලධරයන් මෙන් නො ව ජනාධිපතිවරයා බැරෑරුම් ලෙස සාමය පිලිබඳව උනන්දු වන්නේ ය යන මායාවට උල්පන්දම් දෙමින් ද ඩේලි මිරර් පුවත්පත ඊට ප්‍රතිචාර දැක්වී ය.

"අතිශයින් අවශ්‍ය කෙරෙන සාමයක් රැගෙන එනු පිනිස රට එක්සත් කිරීමේ දුෂ්කර කටයුත්තෙහි ජනාධිපති රාජපක්ෂ නියැලී සිටින මොහොතක දී ඔහුගේ විශ්වාසී උසස් නිලධරයන්ගේ පාර්ශ්වයෙන් සිදු වන මේ ආකාර වූ හැසිරීම් ඔහුගේ දෙපාවලට යටින් වල කැපීමට දරන ප්‍රයත්නයන් ලෙස හෙලා දැකිය හැකි ය" යි කතුවැකිය පැවසී ය. තම කන්ඩායම ඇයට හානි නොකරන බවට කරුනා කන්ඩායම ලියනාරච්චිට දැනුම් දී ඇති බව ද එය සඳහන් කොට තිබේ.

තමන් "සාමයේ වීරයකු" බවට රාජපක්ෂ කරන කියාපෑම් මෙන් ම මාධ්‍ය අයිතීන් රකින වීරයෙකු ලෙස පෙලහර පෑමට ඔහු දරන ප්‍රයත්නයන් ද හුදෙක් ප්‍රදර්ශනාත්මක වූවකි. ආන්ඩුවේ ජාතික ආරක්ෂාව පිලිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය (එම්සීඑන්එස්) කල ප්‍රකාශයක් මගින් ඩේලි මිරර් පුවත්පතට එරෙහි

උද්ඝෝෂනය අඛන්ඩව පෙරට ගෙන ගියේ ය. එය ප්‍රකෝපකාරී ලෙස මෙසේ කියා සිටියේ යඃ "ආරක්ෂක ලේකම්වරයාට එරෙහිව එල්ල වූ මෑත ම චෝදනාව දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය තෘප්තිමත් කිරීමේ අරමුනින් යුතුව ඔහු තනතුරින් ඉවත් කිරීම සඳහා ගෙන යන පුලුල් සැලසුමක කොටසක් බව ආන්ඩුව විශ්වාස කරයි."

මාධ්‍යයට එරෙහි ආන්ඩුවේ ප්‍රහාරය සැබවින්ම තීව්‍ර වෙමින් පවතී. ලියනාරච්චිට තර්ජනය කිරීමට යන්තම් දිනකට පෙර උතුරු පලාතේ මායිම් නගරය වන වව්නියාවේ දී නිලම් සඟරාවේ කතුවරයා මෙන් ම අනෙකුත් දෙමල මාධ්‍යවලට ප්‍රතිපදානයන් කරන්නකු ද වූ සුබාස් චන්ද්‍රබෝස් ඝාතනය කරන ලදි.

සිංහල බසින් සතිපතා පල වන ප්‍රමුඛ පුවත්පතක් වන *මව්බිම* හා ඉංග්‍රීසි බසින් සතිපතා පල වන *සන්ඩේ ස්ටෑන්ඩර්ඩ්* පුවත්පත ප්‍රකාශයට පත් කරන ස්ටෑන්ඩර්ඩ් නිව්ස්පේපර්ස් සමාගමේ වත්කම් ආන්ඩුව විසින් අත්හිටුවීමෙන් පසුව මාර්තු 29 වන දා සිට සිය ප්‍රකාශන පල කිරීම නවතා දැමීමට එම සමාගමට බල කෙරින. පොලීසියේ ත්‍රස්ත විමර්ශන ඒකකය (ටීඅයිඩී) ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ සමාගමේ ප්‍රකාශකයා සහ මූල්‍ය අධ්‍යක්ෂවරයා වූ දුෂ්‍යන්ත බස්නායක අත් අඩංගුවට ගෙන, පෙබරවාරි 27 වන දා සිට චෝදනා ඉදිරිපත් කිරීමකින් තොරව රඳවා ගෙන සිටී.

*මව්බිම* පුවත්පත පසු ගිය වසරේ දී ආන්ඩුවේ දූෂනයන් හා මානව අයිතීන් උල්ලංඝනය කිරීම් පිලිබඳව වාර්තා කලේ ය. මිලිටරිය හා එල්ටීටීඊය අතර සටන් ඉහල යාමත් සමග පැහැර ගෙන යාම් හා "අතුරුදන් වීම්" වඩ වඩාත් පුලුල් වීම සම්බන්ධයෙන් ආන්ඩුව ඉටු කරන කාර්ය භාරය එහි මාධ්‍යවේදීන් විසින් ප්‍රශ්නයට ලක් කෙරින. එම මාධ්‍ය සමූහය අයත් වන්නේ ජනාධිපති රාජපක්ෂ සමග ගැටීමෙන් අනතුරුව පෙබරවාරියේ දී නෙරපා හල හිටපු ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙකු වූ මංගල සමරවීරගේ මිතුරෙකුට ය. එල්ටීටීඊයට සහාය දැක්වීම පිලිබඳවත් "ජාතික ආරක්ෂාව" අනතුරේ හෙලීම පිලිබඳවත් ජනාධිපතිවරයා සහ ආරක්ෂක ලෙක්ම්වරයා යන දෙදෙනා ම *මව්බිම* පුවත්පතට චෝදනා කලහ.

මාධ්‍යයට එරෙහිව ගන්නා මෙම ක්‍රියා මාර්ග වනාහි සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කරන පුලුල් ප්‍රහාරයක කොටසකි. යුද්ධය සහ ඒ සමග ජීවන තත්ත්වයන් මත එල්ල කරන ප්‍රහාරය තීව්‍ර කිරීමත් සමග ම සිය බොරු පිලිබඳව කරනු ලබන කවර විවේචනයක් හෝ හෙලිදරව් කිරීමක් වුව ඉවසා සිටීමට ද රාජපක්ෂ ආන්ඩුවට නොහැකි ය.

© www.wsws.org